# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.01.27 පැය 1140 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 152 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2025.01.26 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාතර්‍ාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 83 | 880 | තඹ දඟර 02<br>බැරල් 06<br>බූලි 01<br>බට 01<br>ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. නිල් තල් මසෙකුට අයත් අම්බර් කොටසක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර.**

2025.01.26 වන දින දහවල් කාලයේ රත්ගම පොලිස් වසමේ රත්ගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර දැඩි ආරක්ෂිත ක්ෂීරපායි සත්වයෙකු වන නිල් තල් මසෙකුට අයත් අම්බර් කොටසක් ළඟ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රත්ගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රත්ගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල සේනාංක බුද්ධි අංශය.**

2025.01.26 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල සේනාංක බුද්ධි අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තෙලිකඩ පොලිස් වසමේ බූස්ස ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 130 ක් හා ජංගම දුරකතනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තෙලිකඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 18 ක් වන බූස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

තෙලිකඩ පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල සේනාංක බුද්ධි අංශය.**

2025.01.26 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල සේනාංක බුද්ධි අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගාල්ල පොලිස් වසමේ කන්දේවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 20 ක්, ජංගම දුරකතන 02 ක් හා විද්‍යුත් තරාදි 01ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගාල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන බූස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

ගාල්ල පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**